**පිළිසරු ව්‍යාපෘතිය - 2012**

1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) මාගේ පෙර වර්ෂ වල විගණන වාර්තා වලින් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වියදම රු.399,882,098 ක් ද ,ඉකුත් වර්ෂය සඳහා වියදම රු.484,580,589 ක් සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.884,462,687 ක් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| විෂයය | 2012 වර්ෂය සඳහා වියදම | 2011 වර්ෂය සඳහා වියදම | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| i. කොම්පෝස්ට් අංගන ඉදිකිරීම | 55,297,185 | 192,345,425 | 247,642,610 |
| ii. ඉඩම් පිරවුම් ඉදිකිරීම | 4,255,164 | 11,800,505 | 16,055,669 |

| | | | | |
|---|---|---|---|---|
| iii. | කුඩා පරිමාණයේ කොම්පෝස්ට් අංගන සහ ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන් | 302,556,119 | 225,283,914 | 527,840,033 |
| iv. | ප්‍රවාහන (ඉන්ධන හා නඩත්තු) | 4,059,468 | 2,765,910 | 6,825,378 |
| v. | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය සැපයුම් | 2,002,499 | 1,317,123 | 3,319,622 |
| vi. | වැටුප් | 22,573,584 | 21,857,374 | 44,430,958 |
| vii. | තැපැල් හා සන්නිවේදන | 349,013 | 904,967 | 1,253,980 |
| viii. | ව්‍යාපෘති සම්බන්ධීකරණය සහ කළමනාකරණය | 204,066 | 128,604 | 332,670 |
| ix. | කාර්යාල කුලී | 3,408,800 | 3,528,800 | 6,937,600 |
| | **කාර්යාලීය වියදම්** | | | |
| x. | අතිකාල දීමනා | 2,483,391 | 2,277,631 | 4,761,022 |
| xi. | බැංකු ගාස්තු සහ හර බදු | 20,100 | 273,780 | 293,880 |
| xii. | කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයට අදාල වියදම් (KOICA Expenses) | - | 18,982,331 | 18,982,331 |
| xiii. | රක්ෂණ | 254,937 | 535,795 | 790,732 |
| xiv. | වාහන සේවා කිරීම් හා අළුත්වැඩියාව | 2,383,072 | 2,487,159 | 4,870,231 |
| xv. | වෙනත් (Miscellaneous) | 34,700 | 91,271 | 125,971 |
| | | 399,882,098 | 484,580,589 | 884,462,687 |

3. විගණන නිරීක්ෂණ

---------------------

3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට රු. 6,367,019 ක් වූ නිරවුල් නොකළ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ආ) ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනයේ මධ්‍යම පරිසර අධිකාරියේ හරිත සම්මාන උළෙලට රු.3,000,000 ක් ගෙවිය යුතු වුවද අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනය අනුව ව්‍යාපෘතියෙන් අයවිය යුතු මුදල රු.4,375,000 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට  කටයුතු කර නොතිබුණි.

3.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 103 (ii)ඊ, 104 (i) සහ 105  (i) | වාහනයට  සිදු වූ රු.6,050,000 ක අලාභය වගකිවයුතු  නිලධාරීන්ගෙන් අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | 2008 මාර්තු 19 දිනැති අංක PF/429 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4. (i) මාර්ගෝපදේශය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව වැඩ පූර්ව අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයක් ගෙවිය හැකි වුවද, කුඩා පරිමාණ කොම්පෝස්ට් ව්‍යාපෘති 03 ක් සඳහා සියයට 30 ක් එනම් රු. 6,812,874 ක් අත්තිකාරම් ගෙවා තිබුණි. |

(ඇ) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ

| | |
|---|---|
| (i) 04 ඡේදය | ව්‍යාපෘති අධ්‍යක්ෂ සඳහා වෙන්කළ වාහනයක් ලබාදී තිබුනත්, ඔහු විසින් අවස්ථා 36 කදී සංචිත වාහන භාවිතා කර තිබුණි. |
| (ii) 07 ඡේදය | නිලධාරීන් 06 දෙනෙකු විසින් උපරිම දුර සීමාව වන කිලෝමීටර් 50 ක් ඉක්මවා, කාර්යාලය සහ නිවස දක්වා යෑම් ඒම් කර තිබුණි. |
| (ඇ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | වාහන වල මාස 06කට වරක් ඉන්ධන දැවීම් පරීක්ෂා කළයුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ඉ) 1997 මැයි 23 දිනැති අංක 118 (අ) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ ආයතන සංග්‍රහයේ viii පරිච්ඡේදයේ 10 වගන්තිය | රජයේ නිවාඩු දින වල රාජකාරි වල නිරතවීම වෙනුවෙන් 1/20 දීමනාව මසකට හිමිවන්නේ දින 1ක් වුවත් ඊට පටහැනිව මසකට දින 03 ක් සඳහා නිලධාරීන් 09 දෙනෙකුට එකතුව රු. 260,896 ක මුදලක් ගෙවා තිබුණි. |

3.3 අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව පිළිසරු ව්‍යාපෘතිය සඳහා ලද මුදලින් ව්‍යාපෘතියේ අරමුණු වලින් බැහැරව රු 19,466,819 ක මුදලක් මධ්‍යම පරිසර අධිකාරිය සඳහා වියදම් කර තිබුණි.

3.4 ව්‍යාපෘතිය සතුව වාහන 04 ක් පැවති අතර 2012 වර්ෂයේ කුලී වාහන සඳහා රු. 1,737,255 ක් වැයකර තිබුණි. මෙය වර්ෂයේ ඉන්ධන හා නඩත්තු වියදමින් සියයට 40 ක් විය.

3.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

**(අ) ආරම්භ නොකරන ලද ව්‍යාපෘති**

| අත්තිකාරම් දෙන ලද ප්‍රාදේශීය සභාව / නගර සභාව | දෙන ලද අත්තිකාරම් මුදල | නිෂ්කාර්යව පැවති කාලය | වෙනත් |
|---|---|---|---|
| | රු. | | |
| කලවාන ප්‍රාදේශීය සභාව | 903,180 | අවු.03 මාස 02 | ව්‍යාපෘතිය ආරම්භකර නොතිබුණි. |
| ඇල්පිටිය ප්‍රාදේශීය සභාව | 15,252,311 | අවු 03 මාස 03 | ව්‍යාපෘතිය ආරම්භකර නොතිබුණි. |
| ගලෙන් බිඳුනු වැව ප්‍රාදේශීය සභාව | 1,280,663 | වර්ෂ 02 | ප්‍රාදේශීය සභාවේ දේපල තහනමට ලක්වූ නිසා ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. |
| | 17,436,154 | | |

**(ආ) ප්‍රමාද වූ ව්‍යාපෘති**

| පළාත් පාලන ආයතනය | ඇස්තමේන්තු ගත මුදල | 2012.12.31 දිනට ගෙවා තිබූ මුදල | ගිවිසුම අනුව වැඩ අවසාන කළයුතු දිනය | 2012.12.31 දිනට ප්‍රමාද කාලය |
|---|---|---|---|---|
| | රු. | රු. | | |
| කැලණිය ප්‍රාදේශීය සභාව | 13,895,860 | 9,750,216 | 2011.01.31 | අවු01 .මාස 11 |
| මාවතගම ප්‍රාදේශීය සභාව | 6,070,157 | 1,214,031 | 2011.04.04 | අවු.01 මාස 08 |
| කාත්තන්කුඩි නගර සභාව | 8,346,132 | 1,669,226 | 2012.05.29 | මාස 07 |
| නිකවැරටිය ප්‍රාදේශීය සභාව | 2,465,256 | 989,320 | 2011.04.04 | මාස 08 |
| එකතුව | 30,777,405 | 13,622,793 | | |

3.6 සේවක මණ්ඩල කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) මූල්‍ය ප්‍රකාශන වලට අනුව කාර්ය මණ්ඩලය වෙනුවෙන් දැරූ මුළු වියදම රු 25,056,974 ක් වූ අතර එය මුළු මෙහෙයුම් වියදම් වලින් සියයට 52 ක් විය.

(ආ) ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහ නියෝජ්‍ය කළමනාකරු (මහජන සම්බන්ධතා) යන තනතුරු වලට බඳවා ගැනීමේදී තනතුරට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් බඳවාගෙන වැටුප් හා දීමනා ලෙස 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු 6,403,600 ක් ගෙවා තිබුණි. තවද ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයාට ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අවශ්‍ය නිර්මාණ හා සැලසුම් පිළිබඳ සුදුසුකම් හා පලපුරුද්ද නොමැති වීම නිසා මහා පරිමාණ කොම්පෝස්ට් අංගන ඉදිකිරීමේදී නිර්මාණ හා සැලසුම් කිරීම සඳහා උපදේශන සේවා පිටතින් ලබාගැනිම වෙනුවෙන් රු. 6,957,514 ක් වැයකිරිමට සිදුවී තිබුණි.

3.7 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

ගෘහස්ත කසල වෙන්කිරීම පිළිබඳ පිළිසරු ව්‍යාපෘතිය මගින් පහත සඳහන් පරිදි දැනුවත් කිරිමේ වැඩසටහන් සඳහා 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු මිලියන 180.35 ක් වැයකර තිබුණි. එසේ තිබියදී කසල වෙන්කිරිම සඳහා රු. මිලියන 16.14 ක් වැය කර වාහක පටි පද්ධති 13 ක් මිලදීගෙන තිබුණි. තවද කොලොන්නාව පොතුවිල් කුඹුර, කළුතර පොහොරවත්ත සහ හික්කඩුව මොන්-රෝවියාවත්ත නමැති මහා පරිමාණ කොම්පෝස්ට් අංගන වල මෙම වාහක පටි පද්ධති ක්‍රියාත්මක වි නොතිබුණි.

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| වෙන්කළ කසල බඳුන් සැපයීම සඳහා වැයකළ මුදල (ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව) | 16.80 | 40.80 | 12.75 | 19.43 | 5.30 | 95.08 |
| දැනුවත් කිරිමේ වැඩ සටහන් | 0.72 | 10.94 | 35.06 | 20.81 | 17.74 | 85.27 |
| | 17.52 | 51.74 | 47.81 | 40.24 | 23.04 | 180.35 |

4. භෞතික කාර්යසාධනය

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත  සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පිළිසරු ව්‍යාපෘතිය මගින් 2008 - 2013 කාලය තුළ රු. 415,177,352 ක් වැය කර මහා පරිමාණ කොම්පෝස්ට් අංගන 05 ක් කොළොන්නාව, හික්කඩුව මොන්-රෝවියාවත්ත, අනුරාධපුර නුවරගම්පළාත, කළුතර පොහොරවත්ත හා මැදිරිගිරිය යුධගනාව  යන ස්ථාන වල ඉදිකර තිබුණි.

මෙම මහා පරිමාණ කොම්පෝස්ට් අංගනයක දෛනික කසල මෙට්‍රික් ටොන් 35-50 ත් අතර ප්‍රමාණයක් කළමනාකරණය කිරීමට සැලසුම්කර තිබුණි. එසේ වුවද ෙභෟතිකව පරීක්ෂා කරන අවස්ථාවේදී හික්කඩුව කොම්පෝස්ට් අංගනයට කසල ට්‍රැක්ටර් ලෝඩ් 10 ක් ද, කොළොන්නාව පොතුවිල්කුඹුර අංගනයට කසල මෙට්‍රික් ටොන් 10-15 ත් අතර ප්‍රමාණයක් ද, කළුතර පොහොරවත්ත අංගනයට කසල මෙට්‍රික් ටොන්  30 ක් ද වශයෙන් දෛනිකව ලැබී තිබුණි.  මේ අනුව සැලසුම් ප්‍රකාරව කොම්පෝස්ට් අංගන වල ධාරිතාවයට අවශ්‍ය කසල ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) කොම්පෝස්ට් අංගන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) හික්කඩුව මොන්-රෝවියාවත්ත කොම්පෝස්ට් අංගනය**

- වර්ගීකරණය කරන ලද ට්‍රැක්ටර් ලෝඩ් 10 ක් පමණ අංගනයට භාරගනු ලැබේ. තවද වර්ගීකරණය නොකරන ලද  කසල ට්‍රැක්ටර් ලෝඩ් 10 ක් පමණ කළමනාකරණය නොකර වෙනම ගොඩගසා තිබීම නිසා පරිසර දූෂණය වීමට එය බලපා තිබුණි.

- මෙම කොම්පෝස්ට් අංගනයට පළාත් පාලන ආයතන 07 ක කසල ලබාගැනිමට සැලසුම් කර තිබුණද ආයතන 03 ක කසල පමණක් අංගනයට ලැබී තිබුණි.

- වතුර මෝටරය සඳහා විදුලි සම්බන්ධතා 2012 දෙසැම්බර් 31 දින දක්වා ලබාදී නොතිබුණි. කොම්පෝස්ට් අංගනයේ වහලයෙන් හා වැහි පීලි වලින් ජලය කාන්දු වීම නිසා අංගනයේ කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

- හික්කඩුව කොම්පෝස්ට් අංගනයට සැලසුම් කළ කසල ප්‍රමාණය නොලැබෙන බැවින් හා 2012 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත පරිදි කොම්පෝස්ට් නිෂ්පාදනය කර නොතිබුණු අතර හලර් යන්ත්‍ර 02 ක් හා බොබ් කැට් යන්ත්‍රයක් නිශ්කාර්යව පැවතුණි.

(ii) **කොළොන්නාව පොතුවිල්කුඹුර කොම්පෝස්ට් අංගනය**

- සේදවත්ත හා ඔරුගොඩවත්ත ප්‍රදේශ වලින් ලැබෙන කසල වෙන් නොකිරීම නිසා එම කසල, අංගනයට නොගෙන අසල පිහිටි කොළඹ කසල කන්දට අපහරණය කර තිබුණි.

- කොළඹ මහ නගර සභාවේ දෛනිකව කසල මෙට්‍රික් ටොන් 800 ක් පමණ එළිමහනේ ගොඩගසන අතර එම හේතුවෙන් කොම්පෝස්ට් අංගනය වටා රු. 769,557 ක් වැය කර ඉදිකළ දැල් වැට සහ කසල ලොරි රථ පැමිණීමට නියමිත මාර්ගයක් ද අවහිර වී තිබුණි.

- කොළොන්නාව කොම්පෝස්ට් අංගනය සඳහා රු. 3,723,711 ක් වැයකර වාහක පටි පද්ධති 03 ක් සවිකර තිබුණත් වාහක පටි ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයේ පැවතුණි. ව්‍යාපෘති ඉංජිනේරුවරයා විසින් මෙම වාහක පටි පද්ධති 03 නිසි පරිදි ස්ථාපිත කර ක්‍රියාත්මක වන බව සහතික කර ගෙවීම් කර තිබුණද මාස 2 1/2 ක් වැනි කෙටි කාලයක් තුළදී එය අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණි.

(iii) 2011 හා 2012 වර්ෂ වල දැනුවත් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් රු. 38,555,020 ක් වැයකර තිබුණද මහජනතාවගේ කසල වෙන්කර ලබාදීමට යොමුවීම දුර්වල බව කොම්පෝස්ට් අංගන පරික්ෂාවේදී අනාවරණය විය.